මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர<br>Secretary | 081-2213096 | සහකාරලේකම්<br>உதவிசெயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේඅංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/9/1/12026-1 | ඔබේඅංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025-09-30 |

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**<u>මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණිය / කළමනාකරණ සේවා නිලධාරී සේවය සහ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී අධිශ්‍රේණිය, කළමනාකරණ සේවා නිලධාරී සේවය සහ කාර්යාල සේවක සේවය යන සේවාවන්ට අදාළ 2026 වසරේ වාර්ෂික ස්ථාන මාරුවීම් **2026.01.01** දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

02. අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති ඉහත සේවාවන්ට අදාළ නිලධාරින්ගේ 2026 වසරේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු නියෝග සහිත ලේඛනය <u>භාගත කරගන්නා</u> ලෙස මෙයින් දන්වන අතර, ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් නව සේවා ස්ථානයේ **2026.01.01** දින රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි මුදාහැරිය යුතු බවද කාරුණිකව දන්වමි.

03. **එසේම, 2022,2023,2024 හා 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ මේ දක්වා නව සේවා ස්ථාන වෙත මුදා හැර නොමැති කළමනාකරණ සේවා නිලධාරී අධිශ්‍රේණියේ නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන් හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සිටී නම් එම නිලධාරීන් නව සේවා ස්ථාන වෙත මුදාහරින ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.**

04. තවද, වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව ඔබ කාර්යාලය යටතේ ඇති උප කාර්යාල සහ වෙනත් සේවා ස්ථාන වෙත අනුයුක්ත කර ඇති සියළුම නිලධාරීන් ද දැනුවත් කරන ලෙස සහ ඒ පිළිබඳ අභියාචනා ඇත්නම් අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති පහත සඳහන් **අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පතේ** ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර, <u>ආයතන ප්‍රධානියා මඟින් පමණක්</u> **2025.10.31** දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතු අතර, එදිනට පසුව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් සලකා බැලීමක් සිදු නොකරන බවද, වැඩිදුරටත් සඳහන් කරමි.

| | |
|---|---|
| ම.ප./වා.ස්.මා./SUP-02 | මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව <u>අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත</u> |

කාරු. අ.පි.බ

| | |
|---|---|
| ම.ප./වා.ස්.මා./MSO-02 | මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව <u>අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත</u> |
| ම.ප./වා.ස්.මා./KKS-02 | මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවයේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව <u>අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත</u> |

05. අභියාචනා තීරණයන්ට පසු අවසන් ස්ථාන මාරු නියෝග අනුව **2026.01.01** දින සිට වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග ක්‍රියාත්මක සියළුම නිලධාරීන් **2025.12.31** දින සේවයෙන් පසු නව සේවා ස්ථාන වෙත අනිවාර්යයෙන් මුදාහැරිය යුතු බව මෙයින් කාරුණිකව දන්වමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී.විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත :
1. විගණකාධිපති - අ.ක.ස.

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණිය -2026**

**යෝජිත වාර්ෂික ස්ථාන මාරු නියෝග**

| අනු අංක | කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයාගේ නම | වර්තමාන සේවා ස්ථානය හා තනතුර | වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් ලබා දුන් නියෝගය |
|---|---|---|---|
| 1 | එච්.ඩී.සී.බී. හෙට්ටිපතිරණ මයා | මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය - පරිපාලන නිලධාරී | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ.* |
| 2 | ඊ.එම්.එන්.අතුල බණ්ඩාර ඒකනායක මයා | මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය - පරිපාලන නිලධාරී | 2018.09.03 දින අනුමත වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 විධිවිධාන පරිදි සේවා කාලය සපුරා නොතිබීම මත ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ. |
| 3 | ඩී.එම්.එස්.එස්.කේ. දිසානායක මිය | මූලික රෝහල - තෙල්දෙණිය - පරිපාලන නිලධාරී | 2018.09.03 දින අනුමත වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 විධිවිධාන පරිදි සේවා කාලය සපුරා නොතිබීම මත ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ. |
| 4 | එච්.එම්. ආරියපාල හේරත් මයා | මාතලේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - පරිපාලන නිලධාරී | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ.* |
| 5 | බී.එච්.ජී.ඩබ්.එම්.බී. දසනායක මයා | මූලික රෝහල - හැටන් දික්ඔය- පරිපාලන නිලධාරී | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ.* |
| 6 | යූ.ජී.සී.පී. ජයසූරිය මිය | මූලික රෝහල - රිකිල්ලගස්කඩ | 2018.09.03 දින අනුමත වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 විධිවිධාන පරිදි සේවා කාලය සපුරා නොතිබීම මත ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ. |
| 7 | ආර්.ඩබ්.ආර්.ඩබ්. රඹුක්වැල්ල මිය | දඹුල්ල මහා නගර සභාව - පරිපාලන නිලධාරී | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ.* |
| 8 | ටී.එම්.ආර්.ඩබ්. තෙන්නකෝන් මිය | කඩුගන්නාව නගර සභාව - පරිපාලන නිලධාරී | 2018.09.03 දින අනුමත වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 විධිවිධාන පරිදි සේවා කාලය සපුරා නොතිබීම මත ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ. |
| 9 | යූ.ඩබ්.අයි.යූ. ගොඩකුඹුර මිය | උඩදුම්බර ප්‍රාදේශීය සභාව - ලේකම් | 2018.09.03 දින අනුමත වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2 විධිවිධාන පරිදි සේවා කාලය සපුරා නොතිබීම මත ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ. |

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණිය -2026**
**යෝජිත වාර්ෂික ස්ථාන මාරු නියෝග**

| අනු අංකය | කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයාගේ නම | වර්තමාන සේවා ස්ථානය හා තනතුර | වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් ලබා දුන් නියෝගය |
|---|---|---|---|
| 10 | එස්.කේ. ගුණසේකර මිය | උඩුනුවර ප්‍රාදේශීය සභාව - ලේකම් | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ.* |
| 11 | කේ.පී.එස්.ඩී. පතිරණ මිය | පන්විල ප්‍රාදේශිය සභාව - ලේකම් | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ.* |
| 12 | එච්.එම්.ජී. අජිත් පුෂ්පකුමාර මයා | කොත්මලේ ප්‍රාදේශීය සභාව- ලේකම් | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ.* |
| 13 | ඩී.ඩබ්.සී.එන්. ද සිල්වා මිය | නුවරඑළිය කලාප අධ්‍යාපන කාර්යාලය - පරිපාලන නිලධාරී | ස්ථාන මාරු ක්‍රියාත්මක නොවේ.* |

| | |
|---|---|
| * | දිස්ත්‍රික්ක තුනටම අයත් නිලධරයන් අට දෙනෙකු (08) වැනි සුළු ප්‍රමාණයක් පමණක් මෙවර වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්ව ඇති බැවින් සහ එහිදී ස්ථාන මාරු ඉල්ලා ඇති නිලධරයන් අතරින් තිදෙනකු (03) මහනුවර දිස්ත්‍රික්කයටත්, නිලධරයන් දෙදෙනෙකු (02) මාතලේ දිස්ත්‍රික්කයටත්, නිලධරයන් තිදෙනෙකු (03) නුවරඑළිය දිස්ත්‍රික්කයටත් අයත් සේවා ස්ථානවල සේවයේ නියුතුවූවන් වන බැවින් ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් ලෙස නිලධරයන් ගැලපීම් කිරීමට නොහැකිවීම මත මෙම නිලධරයන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක නොකිරීම සුදුසු බවට ස්ථාන මාරු කමිටුව නියෝග කර ඇත. |
| | එහෙත් මේ වනවිට කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම් සිදුකිරීමේ තරඟ විභාගය ප්‍රකාශයට පත්කර ඇති බැවින්, එළඹෙන වසර තුළ එනම් 2026 වර්ෂය තුළ නව බඳවා ගැනීම් සිදුකිරීමට හැකියාව පැවතීම සැලකිල්ලට ගෙන ස්ථාන මාරු අපේක්ෂිත නිලධරයන්ගේ අනුප්‍රාප්තිකයන් වශයෙන් නවක නිලධාරීන් ගැලපීම් කරමින් අදාළ නිලධරයන් වෙත ස්ථාන මාරු ලබාදීම සුදුසු බවටද ස්ථාන මාරු කමිටුව නිර්දේශ කර ඇත |
| 2026 වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවන ලද අවසන් දිනට පසුව යොමු කරන ලද ස්ථාන මාරු අයදුම්පත් දෙකක් ප්‍රතික්ෂේප කිරීමටද ස්ථාන මාරු කමිටුව තීරණය කර ඇත. | |

**<u>මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරින්ගේ යෝජිත වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධ අභියාචනා ඉදිරිපත් කිරීමේ අයැදුම්පත්‍රය</u>**

**I කොටස**

| | | |
|---|---|---|
| **01** | **නිලධරයා සම්බන්ධ නිල තොරතුරු** | |
| නිලධාරියාගේ සම්පූර්ණ නම | | මයා/මිය/ මෙනවිය |
| වර්තමාන සේවා ස්ථානය | | |

| | |
|---|---|
| **02** | **ලබාදී ඇති ස්ථාන මාරුවීම් සම්බන්ධ තොරතුරු (**වාර්ෂික ස්ථාන මාරුවීම් ලේඛනයේ සඳහන් පරිදි)** |
| **ස්ථාන මාරු අනු අංකය | **ස්ථාන මාරු ලබාදී ඇති නව සේවා ස්ථානය |
| | |

**03 ස්ථාන මාරු අභියාචනය**

**පහත කරුණු මත මා වෙත ලබාදී ඇති ඉහත වාර්ෂික ස්ථාන මාරු නියෝගය නැවත සලකා බලා (සංශෝධනය කරන ලෙස/ අවලංගු කරන ලෙස/ ස්ථාන මාරුවක් ලබාදෙන ලෙස) ............................................................ මෙයින් ඉල්ලා සිටිමි.**

**04 ස්ථාන මාරු අභියාචනා ඉදිරිපත් කිරීමට හේතු**
**(පහත කරුණු සනාථ කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කරන්නේනම් සහතික කළ ඡායා පිටපත් එවිය යුතුය)**

**1.**

**2.**

**3.**

| | | |
|---|---|---|
| **05** | **නැවත ස්ථාන මාරුව ඉල්ලා සිටින ආයතන සම්බන්ධ තොරතුරු** | |
| අනු අංක | ස්ථාන මාරු ඉල්ලා සිටින ආයතනයේ නම | ආයතනය පිහිටි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය |
| i | | |
| ii | | |
| iii | | |

ඉහත අංක 01 සිට 05 දක්වා සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. තවද මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බවද මම දනිමි.

| | | | |
|---|---|---|---|
| දිනය | …………………….. | නිලධාරියාගේ අත්සන | ……………………………… |

**II කොටස**

**06 ප්‍රධාන ලේකම්ගේ/ අමාත්‍යාංශ ලේකම්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානිගේ/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

මෙම නිලධරයාගේ ඉහත සඳහන් කරුණු සලකා බලා මෙම අභියාචනය නිර්දේශ කරමි/නොකරමි.

දිනය : ...........................

.................................................

ප්‍රධාන ලේකම්ගේ/ අමාත්‍යාංශ ලේකම්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ ආයතන ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව